**පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල - 2021**

----------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුම සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිලිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රමිත අංක 01 ක ප්‍රකාරව අරමුදල විසින් උපචිත පදනම මත ගිණුම් තැබිය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී පූර්ව වර්ෂවලට අදාලව හා සමාලෝචිත වර්ෂයට අදාලව ලැබී තිබූ දායක මුදල රු.91,246,749 ක් , මුදල් පදනමට ගිණුම්ගත කර තිබුණි | පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ලබන ප්‍රතිලාභීන් සඳහා මාසික විශ්‍රාම වැටුප් ගෙවීම 2011 වර්ෂයේ සිට මෙම අරමුදල උපයෝගී කොට ගෙන සිදු නොකෙරෙන බැවින් විශ්‍රාම වැටුප් ගෙවීම උපචිත පදනම අනුව ගැළපීම් සිදුකරනු නොලැබේ. | ප්‍රමිත ප්‍රකාරව ආදායම් උපචිත පදනම මත ගිණුම් ගත කළ යුතුය. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේස.

| | විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) | ලැබිය යුතු දායක මුදල | 296,675,317 | 51,783,885 | 244,891,432 | 2021 දෙසැම්බර් මස එවන ලද චෙක්පත් 2021 ජනවාරි මස අප වෙත ලැබීම හේතුවෙන් 2021 දෙසැම්බර් මස | ලැබිය යුතු දායක මුදල් අයකර ගැනීමට පියවර ගත |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | ගිණුම්ගත නොවීම මත මෙම වෙනස නිරූපනය වේ. | යුතුය |
| (ආ) | ලැබිය යුතු දායක මුදල | 31,440,706 | 47,924,861 | 16,484,155 | 2021 වර්ෂයේ අවසන් මාස තුනට අදාල මරණ ඉවත් කිරීම 2021 දෙසැම්බර් මස බිල්පතින් සිදුකරන අතර මේ සම්බන්ධව පළාත් පාලන ආයතන වලට දැනුවත් කිරීම 2022 ජනවාරි මස සිදුකරන බැවින් පළාත් පාලන සේවා අරමුදලේ ගිණුම අනුව 2021.12.31 දිනට ශේෂය අඩුවෙන් පෙන්නුම් කෙරේ. | ලැබිය යුතු දායක මුදල් අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| (ඇ) | ලැබිය යුතු දායක මුදල | 256,491 | 117,690 | 374,181 | මාසික බිල්පත් මඟින් ඒ ඒ ආයතන විසින් ගෙවීමට ඇති මුදල් පිළිබඳ දැනුම් දීමක් සිදුකරනු ලබන අතර මේවනවිටත් කිසිඳු ආයතනයකින් ගෙවිය යුතු දායක මුදලේ වෙනසක් ඇති බවට දැනුම්දීමක් සිදුකර නොමැත. | ලැබියයුතු හා ගෙවිය යුතු ශේෂ නිරවුල් කරගත යුතුය. |

**1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

--------------------------------------------

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ---------- | ----------------- | ---------------------------- | -------------------------- | ------------------ |
| ලැබිය යුතු දායක මුදල් | 566,236,315 | 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව පළාත් පාලන ආයතන 302 ක රු. 1,117,176,437 ක්වූ ලැබිය යුතු දායක මුදලින් පළාත් පාලන ආයතන 123 කට අදාලව රු. 566,236,315 ක ලැබිය යුතු දායක මුදල් සඳහා ශේෂය තහවුරු කිරීම් ලැබී නොතිබුණි. | එකඟ වෙමි. පළාත් පාලන ආයතන වලට ලිපි මඟින් ද දුරකතන ඇමතුම් ලබා දීම මඟින් ද පළාත් පාලන ආයතන නිලධාරීන් සම්බන්ධ කරවාගෙන ලැබිය යුතු දායක මුදල් සඳහා ශේෂයන් තහවුරු කිරීම් ඉදිරියේදී ලබාගැනීමට කටයුතු කරමි. | ශේෂ තහවුරු කිරීම් ලබා ගත යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශ අනුව පළාත් පාලන ආයතන 302 කින් 2021 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු. 455,320,462 දායක මුදල් වර්ෂය තුලදී ලැබී නොතිබුණි. | පළාත් පාලන ආයතන මඟින් ගෙවිය යුතු දායක මුදල් අය කර ගැනීමට මේ වන විටත් ක්‍රියා මාර්ග ගෙන ඇත. දුරකතන ඇමතුම් ලබා දීම මඟින් ද පළාත් පාලන ආයතන නිලධාරීන් දැනුවත් කිරීමටත් මුදල් ගෙන්වා ගැනීමටත් තවදුරටත් කටයුතු කර ඇත. තවද මගේ අංක විවැ/ප/පා/ගි/ ලිගො/02 හා 2021.11.03 දිනැති පළාත් පාලන ආයතන ලිපි මගින් 2020 වර්ෂයේදී කිසිඳු දායක මුදලක් නොගෙවූ ආයතන වෙත ඒ පිළිබඳව දැනුවත් කිරීමට කටයුතු කර ඇත. | ලැබිය යුතු දායක මුදල් අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) | තිරප්පනේ පළාත් පාලන ආයතනයේ මියගිය සාමාජිකයෙකුගෙන් අයවිය යුතු රු.435,356 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි | මේ වනවිට තිරප්පනේ ප්‍රාදේශීය සභාවෙන් අය විය යුතු රු.435,355.76 ක මුදල සහ මහඔය ප්‍රාදේශීය සභාවෙන් අයවිය යුතු රු.0.34ක මුදල ලිපි මගින් පළාත් පාලන ආයතන නිලධාරීන් දැනුවත් කර ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | ලැබිය යුතු දායක මුදල් අයකර ගැනීමට පියවර ගත යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අගෝස්තු 28 දිනැති හා අංක 2/2018 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5 ඡේදය හා 2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 ඡේදය මඟින් ඇතුළත් කළ මුදල් රෙගුලාසි 876 (2) (ආ) | අරමුදල් මගින් අපේක්ෂිත අරමුණු රජයේ අයවැය යටතේ ඉටුකර ගත හැකි නම් එකී අරමුදල් වල කටයුතු අවසන් කල යුතු බවද දක්වා ඇත .ඒ අනුව මෙම අරමුදලේ කටයුතු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ අයවැය ප්‍රතිපාදන සලසාගෙන සිදු කරන බව හා අරමුදල අක්‍රිය තත්වයේ පවතින බව ගිණුම් සටහන් අංක 4 මගින් හෙළිදරව් කර ඇති නමුත් අරමුදල වසා දැමීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 07/2006 අනුව 2016 අයවැය යෝජනා අංක 425 හා 426 මඟින් පාර්ලිමේන්තුවේ පිළිගත් ක්‍රියාදාමයකට අනුකූලව ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත නොවන අරමුදල් සමාලෝචනය කර පාර්ලිමේන්තු පාලනයට යටත් කිරීම සහතික කිරීම පිණිස, මහා භාණ්ඩාගාරය විසින් පත් කරනු ලැබූ | අරමුදල වසා දැමීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | විශේෂ කමිටුවේ 2017 මාර්තු 31 දිනෙන් නිකුත් කරන ලද කමිටු වාර්තාවට අනුව පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල ඇතුළු අරමුදල් පාර්ලිමේන්තු පනතක් මඟින් වසා දැමිය යුතු බවට නිර්දේශ කර ඇත.එසේ වුවත් එකී වාර්තාව සම්බන්ධයෙන් යම් ප්‍රතිපත්ති තීරණයක් ගෙන ක්‍රියාත්මක කිරීම සඳහා බලය ලබා දීමක් පිළිබඳව මෙතෙක් වාර්තා වී නැත. | |
| (ආ) | 2012 පෙබරවාරි 08 දිනැති අංක 01/2012 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | ඒ ඒ මාසයේ අරමුදලට අදාල සාමාජිකයන්ගේ මියයෑම් පිළිබඳ වාර්තා ඊළඟ මාසයේ 25 දිනට පෙර දිස්ත්‍රික් ලේකම් වරුන්ගෙන් ගෙන්වා ගෙන එම වාර්තා අනුව කාලීනව මියයෑම් ගැලපීමට පියවර ගත යුතුය. එසේ නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු දායක මුදල් ගිණුමට හා සමුච්චිත අරමුදල් ගිණුමට 2013 වර්ෂයේ සිට 2021 වර්ෂය අතර කාලයේ දී සාමාජිකයන් 583 ක ගේ මියයෑම්වලට අදාල රු.4,147,147 ක් සමාලෝචිත වර්ෂයේදී ලැබිය යුතු දායක මුදල් ගිණුම හා සමුච්චිත අරමුදල් ගිණුමට ගලපා තිබුණි. | මගේ අංක ප.පා.ගි 3/2/7 හා 2019/02/28 දිනැති ලිපි මඟින් සියලුම පළාත් පාලන ආයතන වල ලේකම්වරු වෙත සාමාජිකයින්ගේ මියයෑම් පිළිබඳ දැනුම් දෙන ලෙස දන්වා යවා ඇත. මේ සඳහා මිය ගිය විශ්‍රාමිකයින් පිළිබඳ තොරතුරු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත දන්වා එවන ලෙස ඉල්ලීම් කරමින් අදාල පළාත් පාලන ආයතන වෙත නාම ලේඛන සමඟ දත්ත පද්ධති යෙන් ලබා ගත හැකි තොරතුරු ලබා දීමට කටයුතු කරමින් පවතී. | විශ්‍රාම වැටුප් චක්‍රලේඛය පරිදි කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය
---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල
--------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 22,710,992 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 2,672,336 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 20,038,656 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට දායක මුදල් ආදායම රු. 4,022,827 කින් අඩුවීම හා වියදම රු. 16,015,828 කින් වැඩි වීමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ ක්‍රියාකාරකම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පළාත් පාලන ආයතන වලින් වර්ෂය තුළ දායක මුදල් ලැබීම් රු. 91,246,749 ක්ම විශ්‍රාම වැටුප් අරමුදලින් ගෙවීම් ලෙස දක්වා තිබුණි. එසේ වුවද, සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාර ප්‍රතිපාදන යොදා ගනිමින් විශ්‍රාමිකයන් 44,018 ක් සඳහා රු. 946,249,496 ක දායක මුදල් ගෙවා තිබීම හේතුවෙන් අරමුදලින් බලාපොරොත්තු වන අරමුණු ඉටු වී නොතිබුණි. | එකඟ වෙමි. | අරමුදලින් බලාපොරොත්තු වන කරයුතු ඉටුකරගැනීමට කටයුතු කලයුතුය. |